# ප්‍රසම්පාදන දැන්වීම
## ජාතික තරඟකාරී ලංසු කැඳවීම
## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

පහත සඳහන් වැඩ විෂය සඳහා වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටු සභාපති වන මා විසින් සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් වෙන් වෙන් වශයෙන් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | වැඩ විෂය | ලියාපදිංචි ශ්‍රේණිය/ ක්ෂේත්‍රය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු (රු.) | ආපසු ගෙවන ලංසු බැඳුම්කර (රු.) | කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තුගත වැඩ වටිනාකම (මිලියන) |
|---|---|---|---|---|---|
| 01 | බෝගහ හන්දිය, මීගස්දෙනිය පාලම ඉදි කිරීම | C6/C5/C4 මාර්ග | 10000.00 | 300,000.00 | 29.3 |

02. මෙම ලංසු කැඳවීම ජාතික තරඟකාරී ක්‍රියාපටිපාටිය යටතේ සිදු කරනු ලබන අතර , මෙම කර්මාන්තයට අදාළ CIDA ශ්‍රේණිගත ප්‍රමුඛතාවය හෝ සබරගමු පළාත් ඉදිකිරීම් කොන්ත්‍රාත් ලියාපදිංචිය පදනම් කර ගනිමින් ලංසුකරුවන් තෝරා ගැනීම සිදුකරනු ලබයි.

03.ඉහත වැඩ විෂයට අදාළ ලංසුපත් **2026.08.31** දින සිට **2026.09.14** දක්වා සතියේ වැඩ කරන දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** දක්වා ඉහත සඳහන් පරිදි ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු වැලිගෙපොල ප්‍රාදේශීය සභාවට මුදලින් ගෙවා ලබාගත යුතුය.

04. සියලුම ලංසුකරුවන් එක් එක් ඉදිකිරීම් සඳහා එම කර්මාන්තය ඉදිරියෙන් සඳහන් ලංසු බැඳුම්කර වටිනාකමට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වාණිජ බැංකුවකින් **2026.09.15** දින සිට **2027.01.12** දක්වා වලංගුවන පරිදි වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් නියෝග කල වහාම කොන්දේසි විරහිතව මුදල් බවට පත් කරවා ගත හැකි(Unconditional On Demand Bank Guarantee) බැංකු ඇපකරයක් සභාපති, ප්‍රාදේශීය සභාව වැලිගෙපොල නමින් හෝ වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ මුදල් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිවල මුල් පිටපත් සෙසු ලංසු ලේඛනවල මුල් පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතුය. සියලුම ලංසු **2026.12.15** දින දක්වා වලංගු විය යුතුය.

05. ඉහත ඉදිකිරීම් පිළිබඳ විස්තර වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ කාර්යාල වේලාවන් තුළදී දැනගත හැකිය. (දුරකථන අංකය - 045-2270410)

06. සාර්ථක ලංසුකරුවන්ට කොන්ත්‍රාත් පිරිනැමීම ඔවුන්ගේ ලියාපදිංචි වටිනාකමට සීමා කරනු ඇත. ලංසු සම්පූර්ණයෙන් හෝ භාගික වශයෙන් ප්‍රතික්ෂේප කිරීමේ හෝ භාර ගැනීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. ලංසු පිටපත් දෙකකින් යුතුව **2026.09.15** දින ප.ව. **2.00** ට පෙර වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ තබා ඇති මුද්‍රා තබන ලද ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීමෙන් හෝ ප්‍රසම්පාදන කමිටු සභාපති, වැලිගෙපොල ප්‍රාදේශීය සභාව ,ඕපනායක. නමට ලියාපදිංචි තැපැලෙන් එවීමෙන් ඉදිරිපත් කළ හැකිය. එම ලංසුපත්හි මුල් පිටපත හා අනු පිටපත ලෙස නම් කර කවරවල බහා වෙන් වෙන්ව මුද්‍රා කර නැවත එක් කවරයක බහා මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතුය.

08. **2026.09.15** දින ප.ව. **2.00** ට ලංසු භාරගෙන අවසන් වී ප.ව. **2.15** ට වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ දී ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ඇත.ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

09. පූර්ව ලංසු සාකච්ඡාව(Pre-bid meeting) 2026.09.11 වන සිකුරාදා දින පෙ.ව.10.00 ට වැලිගෙපොල ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරයේදී පැවැත්වේ.

ප්‍රසම්පාදන කමිටු සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව,
හුණුවල,
ඕපනායක.
2026.8.28